මුතුමුදලිගේ නිශ්ශංකගේ
තවත් සිනමාමය නිර්මාණයක්

මේ අත කාගෙද?

ප්‍රථම මුද්‍රණය : 2023 ජූලි

ISBN 978-624-5552-05-4

මුද්‍රණය -

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත,

කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව - අශෝක කුලතුංග

කවර නිර්මාණය - කලන ගංගනාත්

පරිසනක පිටු සැකසුම - කාවින්දයා රත්නායක

ප්‍රකාශනය

පොත්මී ප්‍රකාශන,

මුතුමුදලිගේ හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම,

කොළඹ 13

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම,

ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.

මුතුමුදලිගේ නිශ්ශංක 2023

පිදුම

මඩ ගැසූ පමණින්

මුතුමුදලිගේ නිශ්ශංකව

ක්ෂේත්‍රයෙන් විසිකළ හැකිවනු ඇතැයි

සිතූ සැමට

අනුකම්පාවෙන්!

පෙර කියවීම

හරිඳු උඩපිටිය
උත්පලා වනිගරත්න
චාරක බණ්ඩාර ගොඩකුඹුර
චතුමි අලහකෝන්
ඉෂාරා ජයසිංහ

Copyright © 2023 Muthumudalige Nissanka

All rights reserved. No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, including photocopying, recording, or other electronic or mechanical methods, without the prior written permission of the publisher, except in the case of brief quotations embodied in critical reviews and certain other noncommercial uses permitted by copyright law. For permission requests, write to the publisher.

PothMee Publication
Web: www.pothmee.com
Hotline: 0776882324

වර්ෂය - 2020

එස්ටෝනියාව

එන්න අපි එස්ටෝනියාවට යමු!

මේ කතාව පටන් ගන්නේ එස්ටෝනියාවේ පැරණිතම නගරයක් වන "කෙයිලා"වලින්. මේ නගරයේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව දහයකටත් එහා දිව යන්නක්. ඒ කියන්නේ ක්‍රිස්තුස් වහන්සේ ඉපදෙන්නත් කලින් හදාපු දේවස්ථානවල නටබුන් පවා මෙම නගරය තුළ දී ඔබට දැකගන්න පුළුවන්. එහෙත් මෙය කුඩා නගරයක් නොවෙයි; මිනිසුන් දස දහසකට අධික ප්‍රමාණයක් ජීවත්වන මදක් විශාල නමුත් අනිකුත් එස්ටෝනියානු නගරවලට වඩා ඓතිහාසික වටිනාකමින් යුත් නගරයක්.

හරි අපි දැන් කතාව පටන් ගමු.

01

ශීතල හිම වැටෙන රාත්‍රියක ඔබ කෙයිලා නගරයේ ඇවිද ගොස් තිබෙනවා ද? එසේනම් එය එතරම් ම මනරම් චමත්කාරජනක රාත්‍රියක් වේවි.

සුදු පාට පුළුන් වැනි හිම පොකුරු එකා පිට එකා පොරකමින් ආකාශයෙන් ඇද වැටෙමින් ඔබ ඇඳ සිටින ඝන ලෝම කබායට ඇද වැටෙන සැටි මොහොතකට සිතන්න. එම හිම පියලිවල සීතල ඔබේ ශරීරය ස්පර්ශ කරද්දි ඒවා ඔබේ ස්නායු තන්තුවලට පවා දැනේවි. එම ශීතල, තන්තු තුළට ගිලා බැස හදවතේ සිහින් දාරයන් පවා ශීත කරාවි. ඔබ හිස ලා සිටින්නේ හමින් කළ කැප් තොප්පියක් නම්, හිම පියලි ඒවා මතින් දියවී බිමට වැටෙද්දි ශීතල සුළඟත් සමඟ එහි ජල වාෂ්ප ඔබේ මුහුණටත් වදීවි. ඔබ නාසය ආවරණය කර නොසිටියහොත් නිසැකව ම එම ශීතල මොළයට කිඳා බැස ඔබේ හිස වේදනාවට පත් කරනු ඇත. මේ ආකාරයෙන් ඔබ ඉදිරියට ම ගමන් ගනිද්දි ආකාශයේ සිට කඩා වැටෙන හිම පියලි ක්‍රමයෙන් වැඩි වේවි. එවිට මාවත්වල අටවා ඇති ස්වේත වර්ණ විදුලි ලාම්පු එළියෙන් ඒවා අමුතු ම ආකාරයේ රටා මවනු ඇත. ඈතින් හමා එන සුළඟේ මිමුනුමත් එම රටාවනුත් එකතුව හිම පියලි ඔබ දෑස් ඉදිරියේ සුළඟේ මියුරු සංගීතයට වසඟ ව නැටුමක් නටන්නේ යැයි ඔබට සිතෙනු නොඅනුමාන ය.

මෙයත් එවන් රාත්‍රියකි.

ඔහුට ද මා කියූ ඒ දේවල් ඒ ආකාරයෙන් ම දැනිණ. ඔහු පැළඳ සිටි කළු පැහැ කැප් තොප්පියට වැටුණු හිම කැට ඒවා මතින් දියවී පහතට වැටෙද්දි සුළඟත් සමඟ ම ඒවායේ වාෂ්ප ඔහුගේ මුහුණට වැදිණ. එහි සීතල ඔහුගේ නාසයෙන් ඇතුල් වී මොළය දක්වා ගලා ගියේ ය. ඔහු ඇඟලා සිටි ඝන පොලිස් කබායට වැටුණු හිම කැට ශරීරය ස්පර්ශ කරද්දි එයින් නැගුණු ශීතලින් ඔහුගෙ හදවත කිලිපොළා ගියේ ය.

එහෙත් මෙම රාත්‍රිය ඔහුට ඔබ සිතන ආකාරයෙන් චමත්කාරජනක රාත්‍රියක් වූයේ නම් නැත.

මීට හෝරාවකට පෙර ඔහු තම පොලිස් කාරයේ උණුසුමට ගුළිවී රාජකාරී අවසන් වී නිවසට යෑමට වේලාව එන තෙක් බලාගෙන සිටියේ ය. නිවසට යා හැකි වේලාව විනාඩි තිහටත් ළඟාවෙත් ම ඔහුගේ සිතට ආයේ වඩාත් උණුසුම් හැඟීමකි. ඉක්මනින් ම නිවසට ගොස් තම බිරිඳට තුරුලු වී නිදා ගැනීමට ඔහු සිතුවේ ය. එසේ සිතමින් ඔහු තම කාරයේ යතුර කරකවා එය පණ ගැංවූවේ ය.

එහෙත් එම මොහොතෙම ආ ඇමතුමකින් සියල්ල ම වෙනස් වී ගියේ ය.

"සර්... ඉක්මනට කෝර්විරාප්වලට එන්න" එයින් කියැවිණ. එම ඇමතුම ආයේ ඔහු විසින් කෝර්විරාප් බස්නැවතුම අසල රාජකාරියට යෙදවූ තම පොලිස් ස්ථානයේ ම සාජන්වරයකුගෙනි.

"මොකක් හරි ලොකු දෙයක්" යෙරාජ් තමන්ට ම තොල් මතුරා ගත්තේ ය.

"එහෙම නැත්නම් ඌ මොකක් හරි පටලවගෙන"

තමා බස්නැවතුමේ නැවැත්වූයේ අලුතින් ම සේවයට පත් ව ආ කොලුවෙක් බැවින් ඔහු එසේ ද සිතුවේ ය. කෙසේ හෝ, ඔහුගේ හදවතට දැනෙමින් තිබුණු උණුසුමත්, තම බිරිඳගේ තුරුලෙහි පහසත් ඔහුට අමතක වී එම ඇමතුම නිසාවෙන් ආ කෝපයෙන් ඔහු වෙළී ගියේ ය. පණ ගංවා තිබුණු කාරය වේගයෙන් කෝර්විරාප් දෙසට හරවා ගත් ඔහු එය කෝර්විරාප් බස්නැවතුම දක්වා පදවන්නට පටන් ගත්තේ ය.

02

ඔහු කාරය කොර්විරාප් බස්නැවතුම පෙනෙන මානයේ වූ පොලිස් මුරකුටිය අසල නවත්වන විටත් ඔහුට ඇමතු පොලිස් සාජන්වරයා ඔහු එනතුරු මග රැක සිටියේ ය. එම සාජන්වරයා ආධුනිකයෙකි. මීට සතියකට පෙර අලුතින් වැඩ බාරගත් අයෙකි. ඒ නිසා ම දැඩි ශීතලේ එහාට මෙහාට වැනෙමින් සිටි ඔහු යෙරාජ්ගේ කාරය දකිත් ම එය ඉදිරියට ආවේ ය.

"කැප්ටන්" ඔහු යෙරාජ්ට සැලියුටයකින් ආචාර කොට එතැන නුදුරේ ම වූ බස්නැවතුමේ නවත්වා තිබුණු බස් රථයක් දෙසට අත දිගු කළේ ය. ශීතල නිසා වැනෙමින් සිටියාක් සේ ම ඔහුගේ මුහුණේ ඇත්තේ ද කැලැඹීමකි. ඔහු වචන පිට කළේ අවිස්වාසයෙන් සහා එම කැලඹීමෙන් යුතු ව ය.

"අතක් කැප්ටන්" ඔහු කීවේ ය.

ආධුනික සාජන්වරයාගේ කැලැඹීම දුටු යෙරාජ්ගේ නළල රැලි ගැසී ගියේ ය. ඔහු කියන්නේ කුමක් දැයි යෙරාජ්ට වැටහුණේ නැත.

"මොකක්?"

"කැප්ටන් අපිට අතක් හම්බුණා අර බස් එකෙන්" සාජන්ට්වරයා යළිත් කීවේ ය. එවර ද සාජන්වරයා කියන්නට තටමන්නේ කුමක් දැයි යෙරාජ්ට නොවැටුණෙන් ඔහු තම සගයා ඉදිරියේ සෘජුව ම හිටගත්තේ ය. යෙරාජ් මඳක් කොට කෙට්ටු සිරුරකින් යුක්ත අයකු වුවත් ඔහුගේ මුහුණේ ඇත්තේ දැඩි බැල්මකි.

"මොන අතක් ද, තමුන් මොනවද කියන්නේ, හරියට කියනවා... ඇයි මොකක්ද වුණේ?"

"හරි කැප්ටන් හරි.." ආධුනික සාජන්වරයා සංසුන් වීමට යත්න දැරීය.

"මම මෙතැන රාජකාරී කරමින් හිටියේ.. එතකොට මට ඇහුණා අර බස් එකෙන්" කී ඔහු අත යළිත් බස් නැවතුමේ නවත්වා ඇති සුදු පැහැ බස්රථයකට දිගු කළේ ය. "ඔව්... ඒ බස් එකේ තමයි... මට ඇහුණා ඒ බස් එක පැත්තෙන් කෑ ගැසිල්ලක්... ඉතින් මම ඒ පැත්තට දුවන් ගියා. මම එතැනට යද්දිත් බස් එකේ ඩ්‍රයිවර්

සූට්කේස් එක ඇරලා. ඒ මිනිහා මෝඩකමට ඒකේ තිබුණ අයිස් බෑග් එකත් ඇරලා බලලා"

"අයිස් බෑග් එකක්"

"ඔව් කැප්ටන්... ඒ අයිස් බෑග් එකේ තමයි අත තියෙන්නේ"

"මොන අත ද?"

"කැප්ටන් ඒක කපලා වෙන් කරපු අතක්... වැළමිට ළඟින් ම කපලා අයින් කරලා. ඒක මොන හේතුවකට හරි අර අයිස් අස්සේ හංගලා ඒ සූයිට්කේස් එකට දාලා"

තම සගයා පවසත් ම යෙරාජ්ගේ හැකිළී තිබුණු දෑස් විශාල වී ගියේ ය.

"එනවා යන්න" කී ඔහු වේගයෙන් එම බස්රථය දෙසට පා නැඟීය.

ඒ යන ගමන් ඔහු ඈත පිහිටි බස්රථය දෙස දෑසත් කුඩා කොට කිහිප වරක් ම බැලුවේ ය. එම බස්රථයේ ඇතුළත විදුලි ලාම්පු තවමත් දල්වා ඇත. එය වටා මිනිසුන් කිහිප දෙනකු හිටගෙන සිටිති.

"තමුසෙට හොඳට ම විශ්වාස ද ඒක අතක් කියලා?" ඔහු තම නිලධාරියාගෙන් ඇසුවේ ය.

"ඔව් සර්, කපලා වෙන් කරපු එකක්"

"හ්ම්" යෙරාජ් බස්රථය දෙස බලාගෙන ම මුමුනමින් ඔහුගේ සාක්කුවෙන් ගත් අත් වැසුම් දෙකක් ද කඩිනමින් පැලඳ ගත්තේ ය.

03

ඔවුහු බස්රථයට සමීප වෙත් ම බස් රථයේ දොර අසල හිටගෙන සිටි මිනිසුන් කිහිප දෙනා එතැනින් මඳක් ඉවත් ව යෙරාජ්ට බස්රථය ඇතුළට යාමට මග සලසා දුන්නේ ය. යෙරාජ් ඔවුන්ව මායිම් කළේ නැත. ඍජු ගමනින් ම බස්රථය තුළට ගිය ඔහු තම කුඩා දෑස් එහාට මෙහාට යවමින් එහි සෑම කොනක් ම හොඳින් නිරීක්ෂණය කළේ ය.

මෙය ප්‍රමාණයෙන් කුඩා බස්රථයක් නිසාවෙන් එහි ආසන පිහිටා ඇත්තේ එකිනෙකට වඩාත් ආසන්නව ය. එහි මැදින් ඇවිද යා හැකි කෙටි පදික තීරුවකි. එම පදික තීරුව කෙළවරෙහි රියැදුරු ආසනයට යාබද ව පොළවෙහි විවෘත වූ කළු පැහැ සූට්කේසයක් ඇත. යෙරාජ්ගේ දෑස් ඒ දෙසට එල්ල වෙත් ම ඔහු අසල සිටි නිලධාරියා "ඒක තමයි කැප්ටන්" යනුවෙන් පැවසූයෙන් යෙරාජ් සෙමෙන් සෙමෙන් තම පියවර ඒ දෙසට තැබුවේ ය.

සූට්කේසය අසලට ම පා තැබූ ඔහු ඒ තුළට නැඹුරු විය.

එය මඳක් ගැඹුරු සූට්කේසයකි. එහි හරි මැද අයිස් පිරවූ බෑගයක් ඇත. බසයේ විදුලි ලාම්පුවල සුදු ආලෝකය එම අයිස් බෑගයට වැදී එය රුධිරයේ පාටින් දිලිසෙමින් ඇත.

"නැත" එහි රතු පාටින් පෙනෙන්නේ අයිස්වලට මිශ්‍ර වී ඇති රුධිරය ම ය. යෙරාජ් ඔහුගේ අතින් බෑගය මඳක් සෙලවූයේ ය.

එවිට අයිස් කැට තුළින් පිටතට ආ අතක් එම රුධිරය මත පාවෙන්නට විය. ඔහුගේ දෑස් එම දර්ශනයෙන් විශාල වී ගිය අතර, ඔහු එක්වර ම හිඳ සිටි තැනින් නැගිට්ටේ ය.

"ඉක්මනට ෆොරෙන්සික් එකට එන්න කියන්න" කී ඔහු තම අත් වැසුම ගලවා ඉණේ වූ වෝකිටෝකිය අතට ගත්තේ ය.

"මේ කැප්ටන් යෙරාජ් ඕජා, කොර්විරාප් බස්නැවතුමෙන්, අපිට කපලා වෙන් කරපු අතක් හමුවුණා... මම ආයෙත් කියනවා, අපිට කපලා වෙන් කරපු අතක් හමුවුණා; කරුණාකර ප්‍රධාන පොලිස් ස්ථානයෙන් කණ්ඩායමක් එවන්න" ඔහු කීවේ ය.

මේ
අත
කාගෙද ?

මුතුමුදලිගේ නිශ්ශංක

04

එතැනින් හෝරාවක කාලයක් ගෙවී ගිය තැන කෙයිලා ගම්මානයට නුදුරෙන් ම වූ වාල්ස් නගරයෙන් පොලිස් කණ්ඩායමක් කොර්විරාප් වෙත ආවෝ ය. එම කණ්ඩායම සමඟ ම එතැනට පැමිණි රස පරික්ෂක කණ්ඩායමක් බස්රථය තුළ රස පරික්ෂක කටයුතු ආරම්භ කළ අතර පොලිස් කණ්ඩායම බස්රථය අසල ස්ථානය එස්ටෝනියන් ආරක්ෂක සංකේත ගැසූ පොලිතීන්වලින් මුද්‍රා තැබීය. මේ අතර වාල්ස් හි පොලිස් ස්ථානාධිපතිවරයා සහා යෙරාප් ඊට මෑතකින් වූ බස්නැවතුමෙහි සිගරට්ටුවක් උරමින් ඒ දෙස බලා සිටියේ ය. හිම පතනය පෙරටත් වඩා වැඩි වෙමින් තිබිණ. අවට දැඩි ශීතලකින් යුක්ත වූයෙන් ඔවුන්ගේ ප්‍රාශ්වසයන් පවා වාතය තුළට එකතු වනු මනාව දැක ගත හැක. යෙරාප්ගේ මුවින් පිටවූ දුම් වළලු එම ශීත වාතය තවත් බොඳ කර දැමීය.

"කොපේ හිතනව ද මේ මනුස්සයා තවම ජීවත් වෙනවා කියලා" යෙරාප් තමා අසල සිටි වාල්ස් හී ප්‍රධාන පොලිස්පති දෙස බලා විමසුවේ ය. ඔහු යෙරාප්ට වඩා තරබාරු ශරීරයක් ඇති අයෙකි.

"වෙන්න පුළුවන්..." ඔහු කීවේ ය. "එහෙම නැත්නම් මළකඳ වෙන කොහෙන් හරි හමුවෙන්නත් පුළුවන්, මේ මාසේ ඇතුළත අපිට අතුරුදහන් වීම් ගැන පැමිණිලි කිහිපයක් ලැබිලා තියෙනවා. මම සුවීට කියන්නම් ඒ ෆයිල් ටිකත් යෙරාප්ට එවන්න කියලා"

ඔහු සුවී නමින් හැඳින්වූයේ තම දෙවැනි නිලධාරිනිය ගැන ය. ඇය සත්මසක ගැබිනියක වුවත් තවමත් ඈ පොලිසියට අනියුක්තව සේවය කරමින් සිටියා ය.

"සුවී නිවාඩු යන්නැද්ද?"

"යන පාටක් පේන්න නැහැ. ඒකිත් හොඳ හයිය ගැහැනියක්... යෙරාප් දන්නවනේ සුවී ගැන, මම හිතන්නෑ දරුවා ලැබෙන්න මාසෙකට කලින් හැරෙන්න සුවී නිවාඩු යයි කියලා"

"එහෙනම් කොපේ මේ පරික්ෂණවලට සුවීව මෙහෙට එවන්න" කී යෙරාප් තමන්ට නුදුරෙන් පොලිස් සංචිතයත් සමඟ

රාජකාරියෙහි යෙදී සිටි ආධුනික සාජන්වරයා දෙස බැලුවේ ය. ඔහු තම කබායට දෑත ම ඔබා ගනිමින් ශීතලයේ වෙවුලමින් පරීක්ෂණ මෙහෙයවන පොලිස් නිලධාරින් අසල හිටගෙන සිටියි.

"මිනිහා තවම මේ වැඩවලට අලුත්, ඔය තමයි මුල් ම එක... ඒකත් කපලා වෙන් කරපු අතක්" ඒ නිසා තවමත් කම්පනයෙන් ඉන්නවා ඇත්තේ"

යෙරාප් එසේ කියද්දී කොපේගේ මුවින් සිහින් සිනහවක් නික්මුණේ ය. ඔහුගේ දෑසත් යෙරාප් විසින් පැවසූ තම පොලිස් ස්ථානයට අලුතින් පත් වී ආ තරුණයා වෙතට යොමු විය.

"යෙරාප්ට මතක ද මගේ මුල් ම පරීක්ෂණය මොකක්ද කියලා?" ඔහු යෙරාප්ගෙන් ඇසුවේ ය. යෙරාප් එය නොදන්නා බව අඟවමින් හිස වැනී ය.

"කපලා වෙන් කරපු ඔළුවක්, ඒකත් වාල්ස් දිය ඇල්ලේ රිටක් උඩ ගහලා තිබ්බේ. මට ඒකේ තිබුණ කෙස් ගසක් ගැන පවා අදත් මතකයි" කී ඔහු අතීතය ආවර්ජනය කරන්නට මෙන් සිගරට්ටුවෙන් දුම් පොදක් වාතයට මුසුකොට දිගු හුස්මක් ඉහළට ඇද ගත්තේ ය.

"1990වේ... වාල්ස්වල කපලා වෙන් කරපු හිස" යෙරාප් මිමුනුවේ ය. එකල ඔහු ද පොලිස් සේවයට ආධුනිකයෙකි. ඒ ඔහු කෙයිලාවලට ආ මුල් කාලයේ ය.

එකල කෙයිලා පොලිස් ස්ථානය වාල්ස් සහා නිත්වෙජා නගර යා කරමින් ඉදිකළ ප්‍රධාන පොලිස් ස්ථානයක් ලෙස වැජඹුණේ ය. එහෙත් ටාලීන්වල සීඝ්‍ර සංවර්ධනයත් සමඟ ම වාල්ස් නගරය ද ක්‍රමයෙන් දියුණු වූ අතට කෙයිලාව එහි පුරාතනභාවයත් රැකගනිමින් ඒ ආකාරයෙන් ම පැවතුණේ ය. වාල්ස් දියුණුවත් සමඟ ම එහි අපරාධ ප්‍රමාණයත් ඉහළ යන්නට වූයෙන් ටාලීන්වල විශේෂ අවධානයත් වාල්ස්වලට ම යොමු වන්නට විය. එය එස්ටෝනියාවේ ප්‍රධාන නගරයක් බවට පත් විය. එහි ප්‍රධාන පොලිස් ස්ථානයක් ද ඉදි කරනු ලැබීය. කෙයිලාවල සේවය කළ අයවත් එයට මාරුකොට දැමුවේ ය. අවසානයේ දී කෙයිලාවේ ඉතිරි වූයේ පැරණි පොලිස් ස්ථානයත් එහි සේවය කළ යෙරාප් ඇතුළු තවත් එක් පොලිස් නිලධාරියෙකුත් පමණි. අනෙකාත් විශ්‍රාම ගිය පසුව වාල්ස්වලින් ම එයට ආධුනික පොලිස් සාජන්වරයකු

එවනු ලැබීය.

කොපේ ඔහුගේ කතාව ආවර්ජනය කරද්දි තම පොලිස් ස්ථානයේ අතීතය ගැනත් වාල්ස් එය අභිබවා නැගී සිටි ආකාරයත් යෙරාජ්ට මතක් වූයෙන් ඔහුගේ හදවත ද සියුම් වේදනාවකින් කිදී ගියේ ය.

"ඔය සිද්දිය වුණේ මම කෙයිලාවලට පත් වෙලා ආපු අලුත. 1990වේ"

"ඔව්" කොපේ ද එය අනුමත කරමින් හිස වැනී ය. "90වේ, මීට අවුරුදු තිහකට කලින්, අපි දෙන්න ම හිටියේ අර කොලුවා අද ඉන්න තැන. ඒ නිසා යෙරාජ් ඌව හොඳට පුහුණු කරන්න ඕන." කෝප් යෙරාජ් දෙස බලමින් ගැඹුරු බවකින් එම වචනය පිට කළේ ය.

"හ්ම්" යෙරාජ් ද එය අනුමත කරන්නාක් මෙන් දැඩි බැල්මකින් තම ආධුනික සගයා දෙස බැලුවේ ය.

"ඌට තව කල් තියෙනවා, ටිකෙන් ටික ඉගෙන ගනියි. කවදා හරි කෙයිලා පොලිසියත් බලාගන්න ඉතුරු වෙන්නේ ඔය මනුස්සයා තමයි, මේක ටාලීන්වලින් වළපල්ලට යැව්වේ නැත්නම්" කී යෙරාජ් ඔහුගේ සිගරට්ටුව පොළවට දමා එය පයෙන් පොඩි කර දැමුවේ නුරුස්සන හැඟීමෙනි. කොපේට එම වචන්වලින් යෙරාජ්ගේ සිතෙහි ටාලින් කෙරෙහි වූ කෝපය දැනුණෙන් ඔහු තම අත යෙරාජ්ගේ උරහිසට තබා සෙලවූයේ ය.

"උන් මේක අයින් කරලා දැම්මොත් උඹ අර කොල්ලත් එක්ක වාල්ස්වලට එන්න ඕන... මර්ජාවත් එක්ක වරෙන්... මම ඉතුරු හැමදේම බලාගන්නම්" ඔහු තම මිත්‍රයාට කුළුපගුව පැවසුවේ ය.

05

කෝර්විරාප් බස්නැවතුමෙන් හමුවූ කපා වෙන්කළ අත ගැන ආරංචිය කෙයිලාවල ව්‍යාප්ත වෙද්දි එම නගරයේ ජීවත් වූ මිනිස්සු එයින් කැලැඹී ගියෝය. කෙයිලාව කුඩා නගරයක් නොවේ. එය දස දහසකට වඩා ජනගහනයකින් යුක්ත වූ, හෙක්ටයාර් එකොළහක

පමණ වපරිසරයක විහිදී තිබුණු මඳක් විශාල නගරයකි. එහෙත් එය සාමකාමී නගරයකි. එහි ජීවත් වූවෝ පැරණි සංස්කෘතියට ප්‍රිය කළ ක්‍රිස්තියානුවන් වූවෙන් මෙම නගරය තුළ අපරාධ සිදුවූයේ ඉතාමත් අවම වශයෙනි. එලෙස සිදුවූ සමහර අපරාධ පවා පල්ලියේ දේවගැතිවරුන්ගේ මැදිහත් වීමෙන් විසඳාලනු ලැබුවෙන් මෙම නගරය එස්ටෝනියාවේ සාමකාමී ම නගරයක් ලෙස ද හඳුන්වනු ලැබීය. එහෙත් මෙම සිදුවීම එම නගරයට කැළැලක් විය. කිසිවකු හෝ තම නගරයේ පාරිශුද්ධ බව කෙලෙසා දැමීමට මෙය ඕනෑකමින් ම කරන්නට ඇතැ'යි නගර වැසියන් පොලීසියට සහා ටාලීන් හී ප්‍රධාන පොලිස් මූලස්ථානයට පැමිණිලි කළෝ ය. මෙම සිද්දිය ම දඩමීමා කරගත් කෙයිලා හී මාධ්‍ය ද ඔවුන් ව තවත් උසි ගන්වන්නට පටන් ගත්තෝ ය. සිදුවීම ගැන විවිධාකාර සහ මනඃකල්පිත ප්‍රවෘත්ති තම වෙබ් අඩවිවල පලකරමින් ඔවුහු එයින් ප්‍රයෝජන ගත්තෝ ය.

සියල්ල ම මේ ආකාරයෙන් සිදුවෙමින් තිබිය දී සිදුවීමෙන් දිනක් ගෙවී ගිය තැන කොපේ සේවය කළ වාල්ස් පොලිස් ස්ථානයට දුරකතන ඇමතුමක් ලැබිණ. එය ආයේ ටාලීන් හී නගරාධිපති කාර්යාලයෙනි. එයින් කියවුණේ "කෙයිලාවෙන් හමුවූ කපා වෙන් කළ අත ගැන සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවක් හැකි ඉක්මනින් නගරාධිපති කාර්යාලයට එවන ලෙස ය."

කෝප් එම ඇමතුමින් සුදු මැලි වී ගියේ ය. තත්වය තවත් උඩු දුවන බවත් මෙහි පරීක්ෂණ සඳහා තම පොලිස් ස්ථානයෙන් කෙනෙකුව ඉක්මනින් ම කෙයිලා කරා පිටත් කර යැවීමේ අවශ්‍යතාවයත් ඔහු එයින් ප්‍රත්‍යක්ෂ කර ගත්තේ ය. ඔහුට තෝරාග ැනීමක් නොවීය. මෙවන් බාරදූර රාජකාරියක් විශ්වාසවන්ත ව භාර දිය හැක්කේ ඇයට පමණී. ඇය කුමන ක්‍රමයකින් හෝ මෙය අවසන් කර දමන බැව් කොපේ දැන සිටියේ ය.

වාල්ස් හි උපපොලිස් පරීක්ෂකවරියක ලෙස සේවය කළ සුවී සෙප්පේ අපේ කතාවට පිවිසෙන්නේ මේ ආකාරයෙනි.

06

සුවී සෙප්පේ තරුණ ය. වයස අවුරුදු තිහක පමණ කාන්තාවක් වූ ඈ බැලූ බැල්මෙන් ම පිරිමියකු මෙන් උස මහත සාමාන්‍ය ගැහැනියකට වඩා විශාල ශරීරයක් තිබූ අයෙකි. ගෙවී ගිය මාස හතක කාලය තුළ ඇයගේ සිරුර තවත් මහතින් වැඩී තිබිණ. මේ සිදුවීම සිදුවන විට ඇය මාස හතක ගැබිනියකි. එස්ටෝනියානු නීතිය අනුව කාන්තාවක් ගර්භනී වූ පළමු මසදී ම ඇයට ප්‍රසූත නිවාඩු සහ දීමනාව ලබා ගත හැක. එහෙත් සුවී සෙප්පෙට එවන් අවශ්‍යතාවයක් නොවීය. රජයේ සලාකය හිතාමතා ම ප්‍රතික්ෂේප කර දැමූ ඇය දරුවා ලැබෙන අවසන් මස දක්වා ම වාල්ස් හී සේවය කිරීමට සූදානම් ව සිටියා ය. හැරත් දරුවකු ලැබෙන පලියට, බඩ මහත් වූ ආකාරයට කාන්තාවකගේ කායික ශක්තිය හීන වන්නේ නැත. එය එලෙස සිදුවෙතැ'යි එස්ටෝනියානුවන් විශ්වාස කළත් සුවී එය විශ්වාස කළේ නැත. බඩ ක්‍රමයෙන් වැඩි වත් ම තම ශක්තියත් ඒ ආකාරයෙන් ම වර්ධනය විය යුතු යැයි තීරණය කළ ඇය දරුවා කුස තුළ සිටිය දී පවා උදෑසන ව්‍යායාම්වල යුක්ත විය. ඇය ශක්තිමත් වූවා සේ ම තම දරුවත් දිනෙක ශක්තිමත් වන බැව් ඇය විශ්වාස කළා ය. විශේෂයෙන් ම ඇයගේ කුස තුළ වර්ධනය වෙන්නේ ගැහැනු කළලයක් බැව් ඈ දැන සිටියෙන්, එය පිරිමියකුටත් වඩා ශක්තිමත් ව වර්ධනය විය යුතු බැව් ඇය සිතුවා ය.

07

ශීත කාලයේ අරුණෝදය ප්‍රියමනාප ය. සූර්ය කිරණ ක්‍රමඃ ක්‍රමයෙන් නැග එද්දි එහි උණුසුම හිම පියලි මත තම අණසක පැතිර වීම ආරම්භ කරයි. උණුසුම වැඩි වෙත් ම හිම පියලි එකට ඇලී දිය වීමට පටන් ගනී. ඒවා ජලය බවට පත් වෙයි. මාර්ග යන් හි ගලා යයි. එවන් මොහොතක සූර්ය රශ්මිය අඩු වී ගිය හොත් ගලාගෙන යන මෙම ජලය පරිසරයේ ශීතලත් සමඟ එකතුව අයිස් බවට පත් වෙයි. ශීත කාලයට අයිස් බැඳුණු මෙවන් මාර්ගයන් අතිශයින් ම භයානක ය. මෙවා නිසා රිය අනතුරු

වැඩි වන අතර ශීත කාලය මිනිස්සු වැඩිපුර ම රිය අනතුරුවලට භාජනය වන කාලය බවට ද පත් වෙති. මේ හේතුව නිසා ම ශීත කාලයට එස්ටෝනියාවේ උදෑසන ආරම්භ වෙන්නේ මාර්ගවලට වැලි අතුරවමිනි. එවන් කාලයන් හී උදෑසන ම එස්ටෝනියානු මාර්ගවල ගමන් කරන ඔබට මාර්ගයට වැලි දමන කම්කරුවන් සහ වැලි හලමින් යන ලොරි රථ අනන්තවත් දැක ගත හැකි වනු ඇත.

සුවී සෙප්පෙත් වාල්ස් සිට කෙයිලා දක්වා යමින් සිටියේ මෙවන් මාර්ගයක ය. ඇය පදවමින් සිටි රෙනොල්ට් ක්ලියෝ වර්ගයේ කළු පැහැ කාරය මාර්ගයේ මැද තීරුවේ ඇති වැලි ඇති සලකුණු දිගේ සීරුවෙන් ඉදිරියට යමින් ඇත. ඒ යන අතරතුර කාරයේ රේඩියෝව දැමූ ඇය එයින් ඇසෙන එස්ටෝනියානු පොප් ගීතයකට සවන් දීමට පටන් ගත්තා ය. එම ගීතයේ තනුවට අනුව තම කුසට කිහිප වරක් තට්ටු කළ ඈ

"ඔයත් මේක අහන්න" කියනවාක් මෙන් යාන්තමින් තොල් මිමුනුවා ය. තමාගේ සිතුවිල තම කුස තුළ සිටින දරුවාටත් ඇසෙතැ'යි සිතූ ඈ එයින් වඩාත් උද්යෝගිමත් වන්නට ඇත. ඇය රේඩියෝවේ හඬ වැඩි කළා ය. එම ගීතයට අනුව හිස වැනුවා ය. උරහිස් තාලෙට රඟෙව්වා ය. ඒ අතර ම ඉරව්වත් එන්න එන්න ම වැඩි වන්නට වූයෙන් ඈ කාරයේ උඩු පියන මත වූ අව් කන්නාඩිය ගෙන ඇයගේ දෑස් ආවරණය කරගත්තා ය.

කාරය වේගයෙන් කෙයිලා නගර සීමාවට ආසන්න වෙමින් තිබිණ. එය නගර සීමා සලකුණු කර ඇති දැන්වීම් පුවරුව අසලට ළං වෙත් ම සුවී එයින් පිනා ගියා ය.

"ඔන්න පිපී අපි කෙයිලාවලට ආවා" ඇය තම කුස තුළ වූ දියණියටත් ඇසෙන්නට කීවා ය. (තම කුස තුළ වැඩෙන්නේ දියණියක් බැව් ස්කෑන් පරීක්ෂණයෙන් ඈ දැනගත් දා පටන් එම දියණිය ව සැබැයින් දැනෙන තුරු ඇයට ඉස්පාසුවක් නැත). කුසට අත තබා කතා කරන සෑම මොහොතක ම ඇයත් තමන් සමඟ කතා කරතැ'යි සුවීට හැඟුණෙන් සුවී නිරන්තරයෙන් ම එසේ කරන්නට පුරුදු වී සිටියා ය. ඇය තම දියණියට "පිපී" ලෙස නම් තැබුයේ ද ඒ නිසා ය. එය සරල ය, උච්චාරණය පහසු ය. එම

අකුරු දෙකෙහි තේරුමක් ඇත්දැ'යි ඈ දැන නොසිටියත් එය තම කුස තුළ සිටින දියණියත් සමඟ කතා කිරීමට පහසු ම නම බැව් ඈ සිතන්නට ඇත.

"ඔයා ඉක්මනට අම්මි ළඟට එන්න ඕන"

ඇය මාර්ගය දෙසටත් අවධානය යොමු කරමින් තම කුසත් එක් අතකින් අල්ලමින් එයට සෙමෙන් තට්ටු කරමින් කීවා ය.

එහෙත් සමඟ ම ඇයගේ දෑස් මාර්ගයේ මීටර් කිහිපයක් ඈතින් වූ යමක් වෙතට ළං විය. දිලිසෙමින් පැවති අයිස් මත කළු බෝලයක් මෙන් මුලින් ම දර්ශනය වූ මෙය පසුව වඩාත් පැහැදිලි ව පෙනෙන්නට වූයෙන් ඇය එක්වර ම වහානයේ තිරිංග තද කළා ය. වහානය අඩි කිහිපයක් ම ඉදිරියට ලිස්සා ගොස් එය හරියට ම එම "සත්වයා" අසලම නතර විය.

ඒ පිනි මුවෙකි.

මාර්ගය හරහා ගමන් කරමින් සිටි ප්‍රමාණයෙන් විශාල පිනි මුවෙකි.

සුවීගේ කාරය පිනි මුවාගේ පාදයන් අසල නතර වත් ම උගේ රවුම් දෙනෙත් සුවී දෙසට හැරිණ. ඌ එම දුඹුරු පැහැ දෑස් තුළින් සුවී දෙස තත්පර කිහිපයක් බලාගෙන සිටියේ ය. එම දෑස් තමන්ට කුමක් හෝ කියන්නැ'යි සුවීට දැනිණ. ඒ නිසා ම ඇයගේ දෑස් ද ඌගේ දෑස් මතට ම රැඳිණ. මෙලෙස ස්වල්ප මොහොතක් ගෙවී ගිය තැන යළිත් මාර්ගය දෙසට හැරුණු පිනි මුවා සෙමින් ගමනින් එතැනින් යන්නට පටන් ගත්තේ ය. සුවී නිසොල්මන් ව ඒ දෙස බලා සිටියා ය. ඌගේ විශාලත්වය සේ ම ඌගේ ගමනේ ඇත්තේ ද ගාම්භීරත්වයකි; මනා වූ උජාරුවකි. එහෙත් ඌ තමන් දෙසට හැරී බලා සිටියේ ඇයි? සුවී සිතුවා ය. එස්ටෝනියාවට පිනි මුවන් විශේෂත්වයක් නොවීය. උන් සුලබ ය. විශේෂයෙන් ම හිමෙන් වැසී ගිය මෙවන් කඳුකර මාවත්වල උන්ව වඩාත් දැක ගත හැක. එහෙත් මෙම සිදුවීමේ කුමක් හෝ විශේෂත්වයක් ඇත. මාර්ගය හරහා ගිය පිනි මුවා එහි අනෙත් පස වූ ලඳු කැලෑව දෙසට ඇවිද ගොස් අතුරුදහන් වී යනතුරු ම ඒ දෙස බලා සිටි සුවී යළිත් තම කාරය පණ ගන්වා ගත්තා ය. ඇය නිහඬ ය... තවමත් ඇයගේ දෑස් තුළ කුතුහලයක් ඇත.

"පිපී ඔයාට එයාට දකින්නයි තිබුනේ, උෆ් මට මොකක් හරි කියන්න හැදුවා... මොකක් ම හරි" කී ඇය තම කුසට තට්ටුවක් දමා යළිත් කාරය වේගවත් කළා ය. ඔවුහු ඒ වන විටත් කෙයිලා නගර සීමාවට අවතීර්ණ වී සිටියෝ ය.

08

කෙයිලා හී පොලිස් ස්ථානය ඉතාමත් කුඩා එකකි. ආදි එස්ටෝනියන් ජනාවාසවල ඇති පරිද්දෙන් තනි කළු ගල් කුට්ටිවලින් සාදා ඇති පැරණි නිවසක් පසුකාලීන ව මඳක් ප්‍රතිසංස්කරණය කොට කාර්යාලයක් ලෙස සකසා තිබිණ. මෙහි ප්‍රධාන දොරෙන් ඇතුල්වෙත් ම ඇති විශාල සාලයෙහි පොලිස් ස්ථානයේ ලේකම්වරිය "කරීනේ" නමින් හැඳින්වූ හැට හැවිදිරි කාන්තාව හිඳගෙන සිටි අතර ඇයට දකුණු පසින් ඇති කාමරය පොලිස් ස්ථානාධිපතිගේ කාමරය ලෙස වෙන් කොට තිබිණ. එහි "පොලිස් ස්ථානාධිපති" යන නාම පුවරුව යටින් "කැප්ටන් යෙරාජ් ඕජා" ලෙස සටහන් කොට ඇත. එයට නුදුරෙන් ම වූ තවත් කාමරයක් නවක සාජන්වරයා වෙනුවෙන් වෙන් වී තිබුණු එකකි. එහි වම් පස ඇතුළට වන්නට කළුගලින් ම තනන ලද කුඩා සිරමැදිරියක් ද ඒ අසල ම පොලිසියේ ගබඩා කාමරය ද විය.

තම කාමරයේ හිඳගෙන සිටි යෙරාජ් හිස ඔසවා ඔහුගේ කාර්යාල බිත්තියේ ඇති ඔරලෝසුව දෙස බැලුවේ ය. එහි හෝරා කට්ට උදෑසන එකොළහට ආසන්න ව ඇත. ඇය වාල්ස්වලින් උදෑසන ම පිටත් වූවා නම් මේ වෙද්දිත් කෙයිලාවලට පැමිණ සිටිය යුතු ය. යෙරාජ් ඔහුගේ පුටුවට හිස තබා දිගු හුස්මක් ඉහළට ඇද ගත්තේ ය. ඔහුගේ දෑස ඔහුගේ හිසට උඩින් ඇති එස්ටෝනියානු පොලිස් සංකේතය දෙසටත් ඊටත් උඩින් බිත්තියෙහි එල්ලා ඇති පිනි මුවෙකුගේ අං තට්ටුවටත් ඇදින. එම අං තට්ටුව ඔහු මෙම පොලිස් ස්ථානයට ආ දා පටන්ම එතැන ඇත. මීට වසර තිහකට පෙරාතුව තරුණ සාජන්වරයකු ලෙස පොලිසියේ වැඩ බාරගත් මුල් කාර්තුවෙත් ඔහු එය මෙම කාමරය තුළ දී මේ ආකාරයෙන් ම දැක ඇත. ගෙවී ගිය වසර තිහ පුරා ම එහි වෙනසක් වී නොමැත. එය එල්ලූ තැන ම තවමත් එලෙසම ඇත. ඒ දෙස බලා සිටියදී ම එක්වර ම ඔහුට පොලිස් ස්ථානය ඉදිරියෙන් වහානයක හඬක්

ඇසුණෙන් ඔහු තම කාර්යාල ජනේලය මඳක් විවර කොට පිටත බැලීය. "කළු පැහැ රෙනෝල්ට්" කාරයක් පොලිස් ස්ථානය ඉදිරියෙහි නවත්වා ඇත.

ඒ කාරය කාගෙ දැයි හඳුනාගත් යෙරාජ් ඕජා මේසය මත වූ හිස් වැසුමත් අතට ගෙන තම ආසනයෙන් නැගී සිටීයේ ය.

09

පොලිස් ස්ථානයට ඇතුල් වෙත් ම යෙරාජ්ව දුටු සුවී එයින් ප්‍රබෝදයට පත් විය. ඇය තම කුස එක් අතෙකින් අල්වාගෙන "පිපී ඔන්න යෙරාජ් අංකල් ඉන්නවා" යැයි මුමුනා සිනහා මුසු මුහුණින් යෙරාජ් ළඟට ඇවිද ගියා ය. යෙරාජ් ඉදිරියට පැමිණ සුවීව වැලඳ ගත්තේ ය. යෙරාජ් කොට අයකු වුවත් සුවී ඔහුට වඩා දෙගුණයක් පමණ මහත කෙනකු වූයෙන් ඇව වැලඳ ගනිද්දී යෙරාජ්ගේ මුහුණින් මතුවූයේ හාස්‍යජනක සිනහවකි. ඔහු එම සිනහවෙන් ම දෑසත් පොඩි කර සුවීගේ කුස දෙස බැලීය.

"දුවෙක් ද පුතෙක් ද?" ඔහු ඇසුවේ ය.

"දුවෙක්..." ඇය එසේ පවසා කුසට තට්ටු කර,

"පිපී ඔයාට ඇහෙනවා දැයි" ඇසූයෙන් යෙරාජ්ගේ මුහුණේ වූ සිනහව එයින් තවත් වැඩි විය.

"පිපී" ඔහු මිමුනුවේ ය.

"ඔව් පිපී" සුවී සෙප්පේ ද පිළිතුරු දුන්නා ය.

යෙරාජ් කටත් උළුක් කර එය ලස්සන නමක් කියන්නාක් මෙන් හැඟීමක් පෑවේ ය. ඒත් සමඟ ම සුවීගේ දෑස යෙරාජ්ට පිටුපසින් වූ පොලිස් කාර්යාලයේ ලේකම්වරිය වෙතට යොමු විය.

"කරිනේ" යැයි මිමුනූ සුවී ඇව වැලඳ ගත්තා ය. කෙයිලා පොලිස් ස්ථානය සුවීට නුපුරුදු තැනක් වූයේ නැත. වාල්ස්වල සේවය කළ පසුගිය වසර දහයක කාලය තුළ ඇය මෙම ස්ථානයට සිය පාරකට වඩා පැමිණ ඇත. ඒ සෑමවිට ම ඔවුන්ගේ හමුවීම මේ ආකාරයට ම සිදුවිය. එහෙත් සුවී, පොලිස් ස්ථානයට පත් වී ආ නවක නිලධාරියා ව දකින්නේ මුල් ම වතාවට නිසාවෙන් යෙරාජ් ඔහුව සුවීට හඳුන්වා දුන්නේ ය.

"සුවී මේ සාජන් අර්වෙඩ්"

සුවී ඔහුට අතට අත දී ආචාර කළා ය. ඔහු තරුණයෙකි. සුවී තරම් ම උස් අයකු වුවත් ඔහුගේ මුහුණේ ඇත්තේ ඔහුගේ වයසටත් වඩා කුඩා පෙනුමකි. එසේම සුවීට ආචාර කරද්දි ඔහුගේ අතේ වූ මෘදු බව සුවීට වැටහුණා ය. එහෙත් එයට අවධානයක් යොමු කිරීමට තරම් කාලයක් සුවීට තිබුණේ නැත. ඇය මෙහි පැමිණි රාජකාරිය මේ මොහොතෙ ම ආරම්භ කළ යුතු ය. තම පොලිස් කබායේ ෂිපරය විවර කළ ඈ එහි ඇතුළත අටවාගෙන සිටි ෆයිල් කවරයක් ගෙන එය කැප්ටන් යෙරාප්ගේ අතෙහි තැබීය.

යෙරාප් එය දිග හැරියේ ය. එහි ඉදිරියෙන් ම වූයේ රිදී පැහැ හිසකෙස්වලින් යුත් තරුණියකගේ ජායා රූපයකි.

"ලුතීනා නොයාල්... මීට මාසෙකට කලින් ටාලීන්වල දී අතුරුදහන් වෙලා තියෙන්නේ" ඇය කීවා ය.

10

සුවී එසේ පවසා කටගත් ම කෙයිලා පොලිස් ස්ථානයේ දුරකතනය නාද දෙන්නට පටන් ගත්තේ ය. එහි බිත්ති තනි කළු ගලෙන් සාදා තිබුණු නිසාවෙන් දුරකතනය නාද වෙත් ම පොලිස් ස්ථානයෙන් ආයේ දෝංකාරයකි. කරීනේ ඉක්මනින් ම රිසීවරය ඇයගේ අතට ගත්තා ය. කැප්ටර් යෙරාප් ඕජාගේ දෑස් තවමත් සුවී විසින් දුන් පින්තූරයට යාවී ඇත. ඒත් සමඟ ම ඔහුගේ කන කරීනේ විසින් පිළිතුරු දෙන්නා වූ ඇමතුමටත් යාවී තිබුණේ ය.

"කොහේද" කරීනේ අසනු ඔහුට ඇසුණෙන් යෙරාප් අනිත් පස හැරී කරීනේ දෙස බැලුවේ ය. ඇයගේ දෑස් විශාල ව යෙරාප් වෙතට එල්ල වී ඇත. ටික වෙලාවකින් ඒ පුදුමයෙන් වික්ෂිප්ත වූ දෑසින් ම ඇය යෙරාප්ට රිසිවරය දික් කළෙන් යෙරාප් ද සැකයෙන් යුක්තව එය අතට ගත්තේ ය.

"හෙලෝ"

"කැප්ටන් ඕජා... මේ කිලිකෝ දේවස්ථානයේ ෆර්ඩෝ පියතුමා... මෙක අන්තිම අසුභ ආරංචියක්, හැකි ඉක්මනින් ම

දේවස්ථානයට එන්න.” ඔහුගේ කටහඬේ ඇත්තේ තැති ගැන්මකි, එසේම නොසන්සුන්කමකි. ෆර්ඩෝ පියතුමා ඉතාමත් ශාන්තිමත් ව කතා කරන තැනැත්තකු වූවෙන් ඔහුගේ මේ ක්ෂනික වෙනස් වීමෙන් ම කුමක් හෝ බරපතල දෙයක් සිදුවී ඇති බැව් කරීනේට හැඟී තිබිණ. එම කටහඬ ඇසෙද්දි එය ම යෙරාජ්ට ද සිතෙන්නට වැඩි වෙලාවක් ගියේ නැත. ඔහු පියතුමාගෙන් තවත් කුමක් හෝ ඇසීමට තැත්කළත් පියතුමා ඒ මොහොතෙ ම රිසිවරය යළිත් තැබූයෙන් යෙරාජ් ද ද්වාරය අසල කොක්කක් මත එල්ලා තිබුණු ඔහුගේ ලෝම ලෝගුව ඇඟලාගෙන පිටත්ව යාමට සූදානම් විය.

“කැප්ටන් මොකක්ද වෙලා තියෙන්නේ?” සුවී ඇසුවා ය.

“දන්නෑ.. එහෙත් මොකක් හරි ලොකු දෙයක් වෙලා තියෙනවා... මේ අවුරුදු කිහිපයට ම පොලීසියට කිලිකෝ දේවස්ථානයෙන් ඇමතුමක් ලැබුණු පළමු වතාව” කී යෙරාජ් කරීනේගේ මුහුණ දෙස බැලුවේ ය. ඇයත් එය අනුමත කරමින් හිස සලා ලොකු කරගත් දෑසින් ම බලා සිටියා ය.

“සුවී... ඔයා විවේක ගන්න..මම ගිහින් බලලා එන්නම්, අර්වෙඩ් ඔයා ෆොරෙන්සික් එකට කෝල් කරන්න, කොර්විරාජ්වලින් හමුවුණ අතේ ඩී. එන්. ඒ වාර්තාව ඉක්මනට අරගන්න... මේ ෆයිල් එකත් මගේ කාමරෙන් තියන්න” කී ඔහු තම අතේ වූ ෆයිල් කවරය අර්විඩ් අත තබා දොර දෙසට හැරිණ. එහෙත් සුවී ද ඔහු පසුපස යන්නට පටන් ගත්තා ය.

“කැප්ටන් මමත් එනවා” තම කබායේ ෂිපරය දමා ගත් ඇය යෙරාජ් ඕජා සමඟ ම පොලිස් ස්ථානයෙන් පිටත් විය.

11

කිලිකෝ දේවස්ථානය ක්‍රිස්තු පූර්ව 14 වන සියවසේ කෙයිලාවල ඉදිකරන ලද පැරණිතම දේවස්ථානයකි. එය එස්ටෝනියාවේ ඇති ඓතිහාසික දේවස්ථාන අතරින් පැරණි ම එකක් ලෙස ද පිළිගනියි. මෙම දේවස්ථානයේ ප්‍රධාන ම කොටස මේ වෙද්දීත් නටබුන් ලෙස අවශේෂ වී ඇති මුත් එහි පැත්තක වූ පසුකාලීන ව ඉදිකරන ලද කුඩා දේවස්ථානය රජය විසින් අලුත් වැඩියා කොට

තිබිණ. එය තම වාසස්ථානය කොට ගෙන ෆර්ඩෝ පියතුමා ජීවත් වූවේ ය. ඔහු වයස අවුරුදු හැත්තෑවක පමණ මහලු පියතුමෙකි. දේවස්ථානයේ ප්‍රධාන කොටස් සියල්ල ම පාහේ නටබුන් බවට පත් වී ඇති බැවින් එහි කිසිදු දේවමෙහෙයක් සිදුවූයේ නැත. විවිධ රටවලින් පැමිණෙන සංචාරකයින්ගෙන් සහ එස්ටෝනියනු වැසියන්ගෙන් ම පමණක් මෙම දේවස්ථානය නඩත්තු වන්නට වූ අතර එම ආධාරවලින් ම ෆර්ඩෝ පියතුමා ද ජීවත් වුයේ ය.

යෙරාජ් තම කාරය දේවස්ථානයේ ගේට්ටුව ඉදිරියෙන් නතර කරත් ම ඔහුව බලාපොරොත්තුවෙන් මග බලා සිටි ෆර්ඩෝ පියතුමා ඔහු ඉදිරියට පැමිණෙන්නට විය. පියතුමාත් සමඟ ම ගේට්ටුව ඉදිරියට දුව ආයේ සුදු පැහැති "හස්කින්" වර්ගයේ බල්ලෙකි. ඌ ගේට්ටුව ඉදිරියේ නතර කළ පොලිස් කාරය දෙස බලමින් බුරන්නට පටන් ගත්තේ ය. ෆර්ඩෝ පියතුමා ඔහුගේ ඇඟිල්ල දිගු කර බල්ලාව පාලනය කිරීමට උත්සහා කළේ ය.

"ඔහොම නැවතියන් ලූනා.. ඔතැන ම නැවතියන්... මේ මහත්තුරු ඇවිත් තියෙන්නේ රාජකාරියට"

ඔහු එසේ කියත් ම බල්ලාගේ බිරීමත් නතර වූ අතර ඌ පියතුමා ඉදිරියේ ම සංසුන්ව හිඳගත්තේ ය. යෙරාජ් සහා සුවී කාරයෙන් බැස පියතුමා අසලට විත් හිටගත්තෝ ය. පියතුමා ඔවුන් දෙදෙනාව කාරුණිකව පිළිගත්තේ ය. එහෙත් ඔහුගේ දෑස්වල ඇත්තේ තැති ගැන්මකි.

"මහා විනාශයක් ඕජා... මහා ම මහා විනාශයක්"

ඔහු යෙරාජ්ගේ දෑස් ළඟට ළං ව වටපිට කිසිවකුටත් නොඇසෙන්නට මුමුනන්නාක් මෙන් කෙඳුරුවේ ය. එහෙත් සමඟ ම ඔහුගේ දෑස සුවී දෙසත් ඇයගේ ඉදිරියට නෙරා විත් ඇති කුසටත් යොමු විය.

"පියතුමනී මේ සුවී සෙප්පේ... ඔබතුමාට මතක ඇති ඇයව" ඔහු එසේ කියත් ම පියතුමා සුවී දෙස දෑස් පුංචි කර බැලුවේ ය.

සුවී ද ආයාසයකින් ව්‍යාජ සිනහවක් මවා ගත්තා ය.

"එහෙත් මේ දැරිවි මේක දකින්න හොඳ නැහැ'යි කියලයි මම

හිතන්නේ" මිමුණූ පියතුමා මොහොතක් සුවී දෙස බලා සිට යළිත් එම තීරණය වෙනස්කර ගත්තේ ය.

"හ්ම් කමක් නැහැ... යමු යමු ඉක්මනට" කියමින් ඔහු කුඩා දේවස්ථානය දෙසට ඇවිදින්නට පටන් ගත්තේ ය. සුවී සහා යෙරාජ් ද ඔහුගේ පිටුපසින් පා නැගුවෝ ය.

12

මෙම කුඩා දේවස්ථානය නටබුන් වී ගිය ප්‍රධාන දේවස්ථානයට වඩා හාත්පසින් ම වෙනස් එකකි. එය දේවස්ථානයක් ලෙස හඳුන්වනවට වඩා ෆර්ඩෝ පියතුමාගේ වාසස්ථානය ලෙස හැඳින්වුවත් වරදක් නැත. එයට ඇතුල් වෙන තැන ඉදිරියෙන් ම ඇත්තේ අල්තාරයක් මත ඉදිකරන ලද ලී කුරුසයකි. එම කුරුසය ප්‍රමාණයෙන් විශාල එකක් වූ අතර එයට ඉදිරියෙන් එක් දිගු බංකුවක් පමණක් තබා ඇත.

දේවස්ථානයට ඇතුල්ව කුරුසයට දෑස් යොමුවත් ම පියතුමා එය ඉදිරියේ වැඳ වැටී ඔහුගේ ශරීරයට කුරුස සලකුණ තබා ගත්තේ ය. ඉන්පසුව ඔහු කුරුසයට පැත්තකින් වූ කුඩා කොරිඩෝවක් දිගේ ඇතුළට ගොස් එහි පිටුපස කොටසේ තිබුණු කාමරයට ඇතුළු විය. එය පියතුමා වාසය කරන කාමරය බැව් දැන සිටි යෙරාජ් එයට ඇතුල් වූයේ නැත. ඔහු සුවීත් සමඟ එහි ද්වාරය ඉදිරියේ හිටගත්තේ ය. එහෙත් පියතුමා ඔවුන් දෙසට හැරුණේ ය.

"ඔබ මේක දකින්න ඕන ඕජා... දෙන්න ම ඇතුළට එන්න" කී පියතුමා ඔවුන් දෙදෙනාවත් කැටුව කාමරය දිගේ ගමන් ගන්නට විය.

මෙය දේවස්ථානයේ ම පිටුපස කොටස වුවත් එය පිටතින් පෙනෙනවාටත් වඩා විශාල ස්ථානයකි. තනි කාමරයකටත් වඩා එය පුද්ගලයින් කිහිප දෙනෙකුට ම වාසය කළ හැකි දැවැන්ත සාලයක් බඳු එකකි. එහි කෙළවරට ම වන්නට තිර රෙදිවලින් ආවරණය කරන ලද පියතුමාගේ නිදන ඇඳ පිහිටා තිබිණ. මෙහි බිත්ති අඩි විස්සක් පමණ උස් වූ නිසාවෙන් කාමරයේ ජනෙල්

තිබුණේ වහලට යා බදව ය. විශාල ජනෙල් පහකින් පමණ කාමරය තුළට පැහැදිලි සූර්යාලෝකය ලැබෙමින් ඇත. කාමරය දිගේ ටික දුරක් ගමන් කළ ෆර්ඩෝ පියතුමා එක්වර ම එතැන බිම තබා තිබුණු බන්දේසියක් ළඟ නතර විය.

"ඕජා... මේ තමයි මම ලූනට කෑම දෙන පිඟාන" කී පියතුමා එම පිඟානට නැඹුරු ව එය අතට ගත්තේ ය.

එහි වූයේ කා ඉතිරි කරන ලද මස් කුට්ටි කිහිපයකි. ඒවා දකිත් ම ඕජාගේ නළල රැලි ගැසී ගියෙන් ඔහු සුවී දෙස බැල්මක් හෙළුවේ ය. පියතුමා එම මස් වැදැලිත් සමඟ තමන්ට කියන්නට හදන්නේ කුමක් දැයි ඔහුට තේරුණේ නැත. ඔහු තමන්ට මෙතැනට පැමිණෙන්නැ'යි පැවසුයේ තවත් විප්පත්තියක් නිසා වෙනැ'යි යෙරාජ් සිතුවත් පියතුමා පිඟාන පෙන්වද්දි එම සිතුවිල්ලත් ඔහුගේ සිතෙන් පහව ගොස් තිබිණ. ඒ නිසා ම ඔහු ඒ කෙරෙහි වැඩි සැලකිල්ලක් කළේ නැත.

පියතුමා කිසිවක් නොකියා තවමත් "බල්ලාට කෑම දෙන" පිඟාන ඔවුනට දික්කොට ගෙන සිටියි.

"පියතුමා අපිට එන්න කිව්වේ" යෙරාජ් එම පිඟානෙන් දෑස් ඉවතට ගනිමින් පියතුමාගෙන් ඇසීය. එහෙත් පියතුමාගේ දෑස් තවමත් රැඳී ඇත්තේ යෙරාජ් දෙස ය. ඔහුගේ අතේ ඇති පිඟානත් උවමනාවෙන් ම යෙරාජ් වෙතට දික් වී ඇත.

"හොඳට බලන්න ඕජා" පිගාන තවත් ටිකක් යෙරාජ්ගේ දෑසට යා කරමින් පියතුමා කීවේ ය.

ඔහු එසේ කියද්දි යෙරාජ් නළලත් රැලි කොටගෙන පිගාන දෙස බැලුවේ ය. එහෙත් එහි වූ මස් වැදලි කිහිපයක් හැරෙන්නට ඔහු වෙනත් කිසිවක් දුටුවේ නැත. සුවී ද පියතුමා පිගාන දික් කරද්දි එයට ළං වී බැලී ය. එහි වූ යමක් ඈ දකින්නට ඇත. එයින් ඇයගේ දෑස් විශාල වී ගියා ය. ඒවායෙන් ආයේ අප්‍රසන්න හැඟීමකි. ඇය තමා සිතුණ දේ ම පියතුමාත් කියන්නට යන්ත දරන්නේ දැයි බැලීමට පියතුමාගේ දෑස් දෙස එම අප්‍රසන්න ලීලාවෙන් ම බැලුවා ය.

"ඔබ හරි..." කී පියතුමා එතැන ම මේසය මත වූ කෝටුවක් ගෙන එම කෝටුවෙන් මස් වැදලි අතර තිබුණු යමක් ඉවතට

ගෙන යෙරාජ් දෙසට දික් කළේ ය.

"මහපොට ඇඟිල්ලක කොටසක් යෙරාජ්... මේක සතෙක්ට අයිති එකක් නෙමෙයි.. මේක මිනිස් ඇඟිල්ලක කොටසක්" පියතුමා එසේ කියත් ම යෙරාජ් "මොකක්" යැයි පුදුමයෙන් පවසමින් කඩිනමින් ඔහුගේ අත් වැසුම් පැලඳ ගත්තේ ය. ඉන්පසුව පියතුමා ඔහු ඉදිරියට දික් කළ කෝට්ටට අතට ගත් ඔහු එහි එල්ලෙමින් තිබුණ එම "ඇඟිල්ලක කොටස" දෙස දෑස් කුඩා කර බැලුවේ ය. එය මහපොට ඇඟිල්ලක උඩු කොටස යි. එහි නියපොත්ත කිසියම් හේතුවක් නිසාවෙන් කැඩී ගොස් තිබුණත්, එය නිසැකව ම මහපොට ඇඟිල්ලක් යැයි ප්‍රත්‍යක්ෂ කරගත් යෙරාජ් ඒ මොහොතේ ම ඔහුගේ දුරකතනයට දෑත් යැව්වේ ය. ඔහු සිතුවේ ෆොරෙන්සික් එකට ඇමතුමක් ගෙන ඉක්මනින් ම ඔවුන් ව මෙම ස්ථානයට ගෙන්වීමට ය. එහෙත් පියතුමා ඔහුව නවත්වා ගත්තේ ය.

"එපා ඕජා" ඔහු කීවේ ය.

"දැනටමත් කෙයිලාවලට අවනම්බුවක් වෙලා ඉවරයි, මේකත් ප්‍රවෘත්ති පත්තරකාරයින් අතට ගියොත් ඊට වඩා නවනින්ගිරාවක් වෙයි. විශේෂයෙන් ම... මගේ දේවස්ථානයට" කී පියතුමා ඔහුගේ පපුවෙහි කුරුස සලකුණ සටහන් කොට යෙරාජ් දෙස ගැඹුරු බැල්මකින් බැලුවේ ය.

"ඒක වෙන්න දෙන්න එපා... පුළුවන් නම් ඔය ගැන පරීක්ෂණ මෙහෙයවීම වෙන විදියකට කරන්න" යැයි පවසා එතැන මේසය මත තිබුණු ඉටි බෑගයක් යෙරාජ් වෙත දික් කළේ ය. යෙරජ්ට පියතුමා කී දෙය වැටහිණ. කෙයිලාව ක්‍රිස්තියානි බැතිමතුන්ගෙන් පිරුණු පෙදෙසකි. මෙහි වසර ගණනකින් අපරාධයක් තියා කුඩා සොරකමක්වත් සිදුවී නොමැත. එවන් පෙදෙසක් කපා වෙන් වී ගිය අතකින් ඇවිස්සී ගියාක් මෙන් මස් පිඟානකින් හමුවූ ඇඟිල්ලකින් ද ඇවිළුණ හොත්, එය මෙම පෙදෙසටවත් එහි පදිංචිව සිටින අයටවත් හොඳකට හිටින්නේ නැත. හැරත් එම ඇඟිල්ල එස්ටෝනියාවේ ආදිතම දේවස්ථානයකින් හමුවූ බැව් පැතිර ගිය හොත්, එය මෙම සිද්ධස්ථානයටත් සිදුවන අවනම්බුවකි.

"හොඳයි පියතුමා.. මම මේක වෙන විදියකට කරන්නම්" කී

යෙරාජ් පියතුමා දික් කළ ඉටි බෑගයට කෝට්ටුවෙන් අල්වාගෙන සිටි ඇඟිල්ලක කොටසත්, එතැන බිම තිබුණු මස් පිඟානත් දමා ගත්තේ ය. ඉන්පසුව යළිත් පියතුමා දෙස හැරුණු ඔහු පියතුමාට ආචාර කොට කාමරයෙන් පිටතට ආවේ ය. ඒ එද්දී යළිත් පියතුමා දෙසට හැරුණු ඔහු මෙසේ ඇසුවේ ය.

"පියතුමා කොහෙන්ද මේ මස් ගත්තේ?"

පියතුමා යෙරාජ් අසලට ළං විය." පල්ලියෙන් පල්ලෙහාට යද්දි හමුවෙන මුල් ම මස් කඩේ" කී පියතුමා මඳක් නතර වී සුවී දෙසත් යෙරාජ් දෙසත් බැල්මක් හෙළුවේ ය.

"ඕජා... ඒක මිනිස්සුන්ට මස් සපයන කඩයක්. ඒ නිසා මේ ආරංචිය ගැන බොහෝම පරිස්සමින් කටයුතු කරන්න ඕන. මේක පිටට ආරංචි වුණොත් මම කලින් කිව්වා වගේ ම කෙයිලාවට ලොකු අවනම්බුවක් වෙන්න පුළුවන්"

"එතකොට පියතුමා මේක ගත්තේ කවද්ද?"

"ඊයේ.... ඊයේ දහවල් තුනට විතර. ඒ කඩේ ඉන්නවා "නකුබී" කියලා ග්‍රීක මනුස්සයෙක්. ඒ උන්දෑ මාව දන්නවා. මම මස් ගනිද්දි ඒ මනුස්සයා ලූනටත් අහක දාන මස් පොඩ්ඩක් බෑග් එකකට දාල දෙනවා. ඔය ඇඟිල්ල තිබ්බේ ඒකේ"

"එතකොට පියතුමාට ලැබුණු මස් බෑගය" යෙරාජ් ඇසීය. එවිට පියතුමා එතැන මේසය මතට ඇඟිල්ල දිගු කළේ ය.

ඔහු එම මස් බෑගය මේසය උඩ ඇති හිම පිරවූ භාජනයක ගිල්වා ඇත. යෙරාජ් එයත් එම භාජනයෙන් ඉවතට ගෙන එය විවෘත කොට බැලීය. එහි ඇත්තේ හොඳින් පොඩි කරන ලද මස් කැබලි ය. ඒවා කුමන වර්ගයේ මාංශයක් දැයි ඒ දෙස බැලූ බැල්මට සොයා ගැනීමට හැකියාවක් කොහෙත්ම නැත.

"මම මේ දෙක ම මගේ මිත්‍රයෙක්ගේ මාර්ගයෙන් පරීක්ෂා කරන්නම්" ඔහු ඒ දෙස බලන ගමන් පියතුමාට කීයෙන් පියතුමා සුසුමක් හෙළා එය අනුමත කළේ ය.

"මේක දෙවියන්ගේ නගරය ඕජා. දෙවියන් වහන්සේ මේ හැමදේම විසඳයි" කී ඔහු තම පපුවේ කුරුසය සලකුණු කොට යෙරාජ්ගේ නළලතත් කුරුසය සටහන් කළේ ය. ඉන්පසුව ඔහු

සුවී දෙසට හැරුණේ ය.

"ඔබතුමිය පිනි මුවන්ගෙන් ඈත් වෙලා ඉන්න. උන් ගර්භනී මව්වරුන්ට කැමති නැහැ. දැන් ශීත කාලය නිසා පිනි මුවන් හැමතැනම..." කී පියතුමා නිහඬව ම දේවස්ථානයෙන් පිටතට ඇවිදින්නට වූයෙන් යෙරාජ් සහ සුවී ද ඔහු පසුපසින් ම වැටුණෝ ය.

13

යෙරාජ් යළිත් කාරයට විත් හිඳගත්තේ ය. ඔහුගේ අතේ වූ පොලිතින් මලු දෙක ඩෑෂ් බෝඩය මත තැබූ ඔහු සුවී දෙස බැල්මක් හෙළුවේ ය. ඇය සිටින්නේ කුමක් හෝ ගැඹුරු කල්පනාවක ය. එසේ කල්පනා කරන ගමන් ඇය තම කුසත් අල්වාගෙන කුමක් හෝ මුමුනයි.

"සුවී" යෙරාජ් ඇයට කතා කළේ ය. එහෙත් ඇයට එය ඇසුණේ නැත.

"සුවී" ඔහු මඳක් ශබ්දයෙන් කීවේ ය. එවිට සුවීව ගැස්සී ගියෙන් ඇය ක්ෂණික බැල්මකින් යෙරාජ් දෙස බැලුවා ය.

"මොකක්ද වෙලා තියෙන්නේ" යෙරාජ් ඇසීය.

"නැහැ" යි කියන්නට මෙන් හිස දෙපසට වැනූ සුවී ජනේලයෙන් අහක බලාගත්තා ය.

ජනේලයෙන් පිටත බලද්දී ඇයගේ දෑස එක හෙල්ලේ ම රැඳුනේ පියතුමා දෙසට ය. ඔහු ද්වාරය අසල හිටගෙන තමන් දෙස ගැඹුරු බැල්මකින් බලාගෙන සිටියි.

ඔවුන් එතැනින් නික්ම පියතුමා විසින් පැවසූ පල්ලියට පහතින් ඇති ප්‍රධාන මාර්ගයේ වූ පළමු මස් කඩය අසල නතර විය. එය කඩ පේළියක් අතර මැද තිබුණු රතු ගල් බිත්තියකින් බැඳ ඇති කුඩා කඩයකි. එම කඩය මුදුනේ "ග්‍රීක මස්" යනුවෙන් පුවරුවක් ගසා ඇත. එය දකිත් ම යෙරාජ්ගේ මුහුණින් යාන්තම් සිනහවක්